# මහවැලි අධිකාරිය යටතේ ඇති කුඹුරු රක්ෂණය කිරීමේ නව වැඩ පිළිවෙල

**රක්ෂණ ක්‍රමයේ පරමාර්ථය :**

ගොවියාගේ ජීවන තත්ත්වය නගා සිටුවීම, කෘෂිකාර්මික නිෂ්පාදනයන් උපරිම මට්ටමකට ගෙන ඒම, වගා පාලුවකදී සැහෙන වන්දි මුදලක් ගොවියාට ලබා දී ඔහුගේ ආර්ථිකය නංවාලීම, සිදුවන පාඩුව ගැන නොසලකා සැකයෙන් හා බියෙන් තොරව ගොවිතැන් කටයුතු සඳහා තම ශ්‍රමය හා මුදල් යෙදවීමට උනන්දු කරවීම සහ කුඹුරු ගොවිතැන් කිරීමට වගා ණය ලබා ගැනීම සඳහා පහසුකම් සැලසීම ද කෘෂිකර්ම රක්ෂණයේ පරමාර්ථය වේ.

**ක්‍රියාත්මක කිරීම :**

කෘෂිකර්ම සංවර්ධන හා පර්යේෂණ අමාත්‍යාංශය යටතේ ඇති කෘෂිකර්ම රක්ෂණ මණ්ඩලය මගින් ක්‍රියාත්මක කෙරේ. මහවැලි අධිකාරිය යටතේ ඇති කුඹුරු රක්ෂණය කිරීම වඩාත් ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට පියවර ගෙන ඇත. මහවැලි අධිකාරියේ සහයෝගය හා සහභාගිත්වය ඇතිව ගොවියාට පහසුකම් රාශියක් ඇති කරමින් නව මුහුණුවරකින් මෙම වැඩ පිළිවෙල ක්‍රියාත්මක කෙරේ.

**රක්ෂණය කිරීම හා වාර මුදල් ගෙවීම :**

කන්න රැස්වීම් තීරණයක් අනුව මහවැලි අධිකාරිය මගින් පිළියෙල කරනු ලබන වගා කාල සටහන් අනුව කෘෂි රක්ෂණ මණ්ඩලයේ මෙහෙයුම් කාල සටහන් සකස් කොට අදාල කන්නයට වාර මුදල් ගෙවියයුතු අවසාන දිනයන් නියම කරනු ලැබේ.

එබැවින් බැංකු වලින් වගා ණය ලබා ගන්නා ගොවි මහතුන් තමන්ගේ වගා ණය ඉල්ලුම් පත්‍ර කල් ඇතිව ඒකක කළමනාකාර මහතා මගින් බැංකුවට ඉදිරිපත් කළ යුතුය. අනතුරුව රක්ෂණ වාර මුදල් බැංකුව මගින් අයකොට ඒ සඳහා රක්ෂණ කුවිතාන්සියක් වාර මුදල් අය කිරීමේ අවසාන දිනයේදී හෝ ඊට පෙර රක්ෂිතයාට බැංකුව මගින් නිකුත් කරනු ලැබේ.

වගා ණය ලබා නොගන්නා ගොවි මහතුන් තම කුඹුරු රක්ෂණය කිරීම සඳහා ඒකක කළමනාකාර මහතා වෙතින් ඒ සඳහා නියමිත පෝරමය පුරවා ඒ මහතා ලවා නිර්දේශ කරවා ගෙන කෘෂිකර්ම රක්ෂණ මණ්ඩලයේ මහවැලි අධිකාරි ප්‍රදේශයේ පිහිටුවා ඇති ශාඛා කාර්යාලයේ (මහවැලි ප්‍රදේශ වෙනුවෙන් වෙනම කාර්යාල පිහිටුවා ඇත) නිලධාරි මහතා වෙත ඉදිරිපත් කළ යුතුය. එවිට කෘෂිකර්ම රක්ෂණ මණ්ඩලයේ ශාඛා කාර්යාලයේ නිලධාරි මහතා නිකුත් කරනු ලබන සහතිකයද ගෙන යැමෙන් බැංකුවට රක්ෂණ වාරිකය ගෙවා කුවිතාන්සියක් ලබාගත හැකිය.

මෙම වාර මුදල් කුවිතාන්සියේ රක්ෂිතවාර නිකුත් කරනු ලබන පිටපත සුරක්ෂිතව තබාගත යුතු අතර, නිකුත් කළ කන්නය සඳහා පමණක් වලංගු වන බවද සැලකිය යුතුය.

**කෘෂි රක්ෂණ මණ්ඩලය**

135, යූනියන් පෙදෙස,
කොළඹ 2.